## රුහුණ විශ්වවිද්‍යාලය

## 2018/2019 ශාස්ත්‍රවේදී උපාධි (සාමාන්‍ය/විශේෂ) 2000 ස්ථලය

## පළමු සමාසික පරීක්ෂණය - 2019 ඔක්තෝබර්/නොවැම්බර්

## GEO 21513/21613 - භූගෝල විද්‍යාවේ නව දැක්ම සහ ප්‍රවේශය

ඕනෑම ප්‍රශ්න <u>හතරකට (04)</u> පිළිතුරු සපයන්න.

**කාලය: පැය 03 යි.**

---

01. (අ) යුරෝපය තුළ ග්‍රීසියේ පිහිටීම සහ එහි භෞතික භූගෝලීය පරිසරය මත, "ග්‍රීසියේ උරුමය" ගොඩනැගුණු ආකාරය සුදුසු උදාහරණ මඟින් පහදන්න.

(ලකුණු 08)

(ආ) භූගෝල විද්‍යාව සහ සිතියම් විද්‍යාව යන විෂයයන්ට ග්‍රීක විද්‍යාඥයන්ගෙන් ලැබුණු දායකත්වය අගයන්න.

(ලකුණු 07)

02. "ක්ලෝඩියස් ටොලමිගේ (ක්‍රි.ව. 85 - 165) ලෝක සිතියම මෙන් ම තොටගමුවේ ශ්‍රී රාහුල හිමිගේ (ක්‍රි.ව. 1408 - 1491) සැළලිහිණි සංදේශය ද ශ්‍රී ලංකාවේ සිතියම් විද්‍යාත්මක තොරතුරු නිරූපණය කරන ඓතිහාසික කෘතීන් ය". මෙම අදහස විවේචනාත්මක ව විමසන්න.

(ලකුණු 15)

03. (අ) 'නූතනවාදය' සහ 'පශ්චාත් නූතනවාදය' යන සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ආ) 'නූතනවාදය' සහ 'පශ්චාත් - නූතනවාදය' භූගෝල විද්‍යාවේ චින්තනය වර්ධනය වීම සඳහා කෙසේ බලපා තිබේ ද? නිදර්ශන සහිත ව විමර්ශනය කරන්න.

(ලකුණු 10)

04. (අ) භූගෝල විද්‍යා ශික්ෂණයේ ප්‍රගමනය සඳහා හේතු වූ "ප්‍රමාණාත්මක විප්ලවය" (Quantitative Revolution) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ආ) "ප්‍රමාණාත්මක විප්ලවය" භූ අවකාශීය යථාර්ථයන් අවබෝධ කරගැනීමට සිදුකරනු ලැබූ දායකත්වය සුදුසු නිදර්ශන මඟින් විමර්ශනය කරන්න.

(ලකුණු 09)

05. සංස්කෘතිය ගෝලීයකරණය යන්න හඳුන්වා එය පර්යන්ත කලාපීය රටවලට කරන බල
කරන ආකාරය නිශ්චිත නිදසුන් සහිත ව විවේචනාත්මක ව විග්‍රහ කරන්න.

(ලකුණු

06. "ගෝලීය ත්‍රස්තවාදය තේරුම් ගැනීම සඳහා යෝග්‍යතම දැක්ම සම්පාදනය කරන්නේ භූ
විද්‍යාවෙනි". මෙම ප්‍රකාශය උචිත න්‍යායන් සහ නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු

07. ශ්‍රී ලංකාවේ භූගෝල විද්‍යා සම්ප්‍රදාය විකාශනය වූ ආකාරය නිශ්චිත නිදසුන් සහිත ව සාක
කරන්න.

(ලකුණු

@@@@@@@@@